# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල්‍යශාලාව

# පුරප්පාඩු

## හදිසි ප්‍රතිකාර ඒකකය (ETU) සඳහා හදිසි ප්‍රතිකාර විශේෂඥ වෛද්‍ය තනතුර

## (Consultant in Emergency Medicine)

### ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ (PGIM) හි, හදිසි ප්‍රතිකාර (Emergency Medicine) පිළිබඳ MD Board Certification) (තීරක මණ්ඩල සහතික කරණය) සහිත රජයේ හෝ පෞද්ගලික රෝහල්වල විශේෂඥ වෛද්‍ය නිලධාරීන් වීම. |
| **වයස** | : | අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. |
| **වැටුප් පරිමාණය** | : | රු. 118,800 – 12X3,645–162,540/= මසකට<br>මෙයට අමතරව රාජ්‍ය අංශයේ ගෙවනු ලබන දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතිරේක දීමනාද ගෙවනු ලැබේ. |
| **රැකියා නියමයන් හා කොන්දේසි** | : | තනතුර ස්ථිර වන අතර, අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් (ETF) පදනම මත වනු ඇත. |

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් ඍජු පිටපතක්ද සමග සිය අයදුම්පත් තමන් දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. තමන් මෙම පත්වීම සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හැරිය හැකිද යන වග අපේක්ෂකයා දැනට සේවය කරන ආයතනයේ ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක්ද අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.

පත්වීම ලබාදීමේ / ලබානොදීමේ පූර්ණ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල්‍යශාලාවේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

අයදුම්කරුවන් විසින් සිය සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (CV) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම්ද ඇතුළත් අයදුම්පත් **2022.03.21** වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවිය යුතුය.

**සභාපති, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2022 මාර්තු මස 02 වන දින.**